# 16 දිය කෙළි වැනුම

සිංහල පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ ලියවුණු සාහිත්‍ය පොත් අතර සංදේශ කාව්‍යවලට වැදගත් තැනක් හිමි වේ. පරෙවි සංදේශය, සැළලිහිණි සංදේශය, කොවුල් සංදේශය, ගිරා සංදේශය හා හංස සංදේශය යන සංදේශ කාව්‍ය කෝට්ටේ යුගයට අයත් වේ. මෙහි දැක්වෙන දියකෙළි වැනුම උපුටා ගෙන ඇත්තේ ගිරා සංදේශයෙනි.



01. සිට ගඟ ඉවුරෙහි සෙද නො සැලීයා
මන රඟ මල්වල මුත වර ලීයා
කොමළඟ පැන යන රඟ උදුලීයා
වියොවග ලෙළ දද සිරි කියෙලීයා

02. කෙළනා ලිය පියවුරු බිත ගැසෙමිනි
විදුනා රළ රොන් වැද වැද වෙසෙසිනි
සොබනා සොමි උවනත නඳ විලසිනි
රඳනා අම කිරණින් පිරි සඳ වැනි

03. කියමින් වෙන වෙන වාසී පෑ බල
ඉඳිමින් දිය තුළ නොපෙනී බෝ කල
පෙනෙමින් තැන තැන විදුලිය සේ දුල
ගසමින් කෙළ කෙළ යෙති දිය කෝකිල

04. විලසින් දිය කෙළ කෙළ යෙත් නොමැලී
වෙසෙසින් නැග රළ රොන් ගඟ ඉපිලී
පහසින් තම එක සරි යයි එකලී
සතොසින් ලොමු දැහැ ගත් සිරි කියෙලී

05. කොමළඟනන් වුවනත් උඩුකුරු කොට
තම මුහුලත් බැඳ පිහිනනු දියපිට
හැම සියපත් හැකිළෙනු සොමි තරිඳුට
මෙම රඟ යයි පානා වැනි දිනිඳුට

06. ඉසිරී දිසි දිය දහරින් අඹරා
සසිරී හුණු ඉඳුසැවු සියපතරා
විසිරී ගිය ගඟ ලතු කොකුමඟරා
අසිරී සිතුවම් දැක්වී එතෙරා

07. නඳනා දන නෙත් පැහැ ලණු ලාසිට
අඳනා මෙන් තම තම වෙත දෙතෙරට
පිහිනා යන එන අඟනන් දියපිට
බඳනා වැනි රන් හේ තොප යතුරට

08. සෙදනා ලෙව්නා ලඳුනා ලෙසිනා
රළිනා ලෙලෙනා සොබනා ගතිනා
නඳනා ගඟනා කෙළෙනා ලියනා
දකිනා මතිනා හදනා තොසිනා

**01. අර්ථ** මෘදු වූ කේශ කලාපයේ මල් ගවසා ගත් ස්ත්‍රීන් ගං ඉවුරෙහි ක්ෂණයක් හෝ නොසැලී සිට වහා ගඟට පැන වැටෙන ආකාරය අනංගයාගේ කොඩි ලෙළදුන් විලාසය ප්‍රකාශ කළේ ය.

**විස්තර** ඒ ස්ත්‍රීන්ගේ මෘදු වූ කෙස් වැටි මල් ගවසා බැඳ ඇත. ඔවුහු ගං ඉවුරෙහි මොහොතක් හෝ නොනැවතී සිටිමින් ගඟ දියට පනිති. ඔවුන් ගඟට පනින ආකාරය ද අනංගයාගේ කොඩි ලෙළ දෙන ආකාරය ප්‍රකාශ කළේ ය.

**02. අර්ථ** ජල ක්‍රීඩා කරන්නාවූ කාන්තාවන්ගේ පයෝධර ප්‍රදේශයේ ගැටී විදින්නා වූ සියුම් දිය බිඳු වැදී අලංකාරවත් වන මුහුණු අමෘත රශ්මියෙන් බබළන පුන් සඳ වැනි වේ.

විස්තර ස්ත්‍රීන්ගේ පපු ප්‍රදේශයේ වැදී සිහින් රළ බිඳු මුහුණට විහිදෙයි. එය මුහුණින් රැස් විහිදෙන්නා හා සමාන ය. එවන් මුහුණු අමෘත රශ්මියෙන් බබළන පුන් සඳ වැනි වේ.

03. අර්ථ ස්ත්‍රීහු තමන්ගේ හපන්කම් කියමින් බලය පෙන්වා බොහෝ වෙලාවක් නොපෙනී දිය යට ඉඳිමින් තැනින් තැන විදුලිය සේ පෙනෙමින් දිය කෝකිල (දියබුං) ගසමින් ක්‍රීඩා කෙරෙමින් යෙති.

විස්තර ස්ත්‍රීන් ක්‍රීඩාශීලී අන්දමින් ජල ක්‍රීඩාවේ යෙදුණු ආකාරය වර්ණිතයි.

04. අර්ථ ස්ත්‍රීන් නොනැවතී ජල ක්‍රීඩා කරමින් යත් ම විශේෂයෙන් නැඟුණා වූ රළෙහි රොන් මතු වී, නදිය කාන්තා ස්පර්ශයෙන් තමා හා එක සමාන යැයි ඒ කාලයෙහි සතුටින් රෝමෝද්ගමනය ගන්නා වූ ආකාරය ප්‍රකාශ කළේ ය.

විස්තර ස්ත්‍රීහු දිය කෙළිමින් යෙති. ඒ හේතු කොට ගෙන ජලරේණු මතුවේ. එය කාන්තා ස්පර්ශය නිසා ගඟේ රෝමෝද්ගමනය වූවාක් මෙනි.

05. අර්ථ කෝමල ස්ත්‍රියක මුහුණ උඩුකුරු කොට එක් කළ අත් බැඳගෙන දිය මතු පිට පිහිනීම (කෙසේ ද යත්) සියලු ම පියුම් චන්ද්‍රයා ඉදිරියේ හැකිළීම මේ ආකාරයැයි සූර්යයාට පාන්නා වැනි ය.

විස්තර උඩුකුරු ව පිහිනන ස්ත්‍රීන්ගේ මුහුණු සඳ වැන්න. ළය මත එක්කළ අත් දෙක හැකිළුණු පියුමක් වැන්න. එය සූර්යයාගේ බන්ධූන් වන නෙලුම් මල් චන්ද්‍රයා ඉදිරියේ හැකිළෙන්නේ මේ ආකාරයට යැයි කියන්නාක් වැනි ය.

06. අර්ථ අහසෙහි විසිරී පෙනුණා වූ ජලධාරා නිසා වැටුණු සියගණන් දේදුනු වලින් පොහොසත් වූ ලාක්ෂා හා කුංකුමාංගරාග පැතිරී ගිය ගඟ, ඒ වෙලාවේ අසිරිමත් සිතියම් දැක්වී ය.

විස්තර ජල ක්‍රීඩාව නිසා විසිරුණු දිය දහර ඉහිරී ගොස් අහසේ පෙනේ. එයින් සිය ගණන් දේදුනු ද පෙනෙන්නට වෙයි. දිය කෙළනා ස්ත්‍රීන්ගේ පයෙහි ගෑ ලතු ද ඇඟ ගෑ කොකුම් ද දියෙහි දිය වී පැතිරී සිටී. ඒ දෙක ම රතු ය. එකල ගඟ ආශ්චර්ය වූ සිතියමක් සේ වෙයි.

07. අර්ථ සතුටට පත් ජනයා නේත්‍ර කාන්ති නමැති යොත් දමා තම තමන් ළඟට උභය තීරයට අදින්නා සේ පීනා යන එන ස්ත්‍රීන් තොපගේ ගමනට දිය මතුයෙහි රන් පාලමක් බඳින්නා වැනි ය.

විස්තර ගඟ දෙපස මිනිස්සු රැස් වී බලා සිටිති. ඔවුන්ගේ ඇස් පැහැය ලණු මෙන් ගඟට වැටී ඇත. ස්ත්‍රීහු එතෙරට මෙතෙරට පීනා යෙති. එය දෙතෙර මිනිසුන් විසින් නෙත් කැලුම් යොතින් ගැහැනුන් තම තමන් වෙත අදින්නා වැන්න. එය ඔබේ යාත්‍රාවට බඳනා ලද රන් පාලමක් වැන්න.

08. අර්ථ නාග ලෝකයෙන් එකෙණෙහි ම ආවා වූ ස්ත්‍රීන් මෙන් රළින් රළ ළෙල දෙන සෝබමාන ශරීරයෙන් යුක්ත වූ, නදියෙහි නාමින් ක්‍රීඩා කරන ඒ ස්ත්‍රීන් දුටු පමණින් හෘදය සතුටින් පිරී ඉතිරී යයි.

**විස්තර** රළින් ලෙළෙන ශරීර ඇති කාන්තාවෝ ගමන් ගත් නාග කන්‍යාවන් මෙන් සෝබමාන වෙති. ඔවුන් දුටු පමණින් සිත සතුටින් පිරීයයි.

## ක්‍රියාකාරකම 01

i. දියට පනින කාන්තාවන් කවියාට පෙනී ඇත්තේ කෙසේ ද?
ii. දිය කෙළනුන්ගේ මුහුණු සඳ සේ දැක්වීමට ඇති හේතු කවරේ ද?
iii. කාන්තාවන් දියෙහි ක්‍රීඩා කළ ආකාරය විස්තර කරන්න.
iv. මිනිසුන් දෙතෙර සිටිමින් පිහිනන්නන් දෙස බලා සිටි ආකාරය කවියා වර්ණනා කොට ඇත්තේ කෙසේ ද?
v. හදනා තොසිනා යන්න අපූරු කාව්‍යෝක්තියෙකි. පැහැදිලි කරන්න.

## ක්‍රියාකාරකම 02

**තේරුම් ලියන්න.**

i. තුනුවඟ, තරිඳු, ඉඳුසැව්, යතුරට, දිනිඳු
ii. නඳනා දන නෙත් පැහැ ලඹු ලා සිට යන කවියෙන් ඉස්මතු වන කාව්‍ය චිත්‍රය විස්තර කරන්න.

## ක්‍රියාකාරකම 03

i. මේ පද්‍ය පන්තිය කණ්ඩායම් වශයෙන් බෙදී ගායනා කරන්න.
ii. පිහිනුම් තරගයක් පිළිබඳ විස්තරයක් බිත්ති පුවත්පතට ලියන්න.

## ක්‍රියාකාරකම 04

* **තොටගමුවේ ශ්‍රී රාහුලහිමිපාණෝ සංදේශ කාව්‍ය දෙකක් ලියූහ.**

මේ ගෞරවාර්ථයේ යෙදෙන විශේෂ වාක්‍ය රීතියකි. එය මැනවින් අවබෝධ කරගන්න.

* පහත සඳහන් එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු පදය ඉහත ඉදිරිපත් කළ උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ විශේෂ වාක්‍ය රීතිය පිළිබඳ ව ද සැලකිලිමත් ව සම්පූර්ණ කරන්න.

i. නාහිමිපාණෝ උත්සවය සඳහා පැමිණි සිටි පිරිස පළමු කොට පංචශීලයෙහි ..................................................

ii. කැලණි නදී තොමෝ සමනල කන්ද මුදුනේ සිට සමුද්‍රය කරා ගලා ...............................

iii. මාගේ බාල මලණුවෝ වැඩිදුර අධ්‍යාපනය ලැබීමට විදේශ ගත ...............................

iv. මහ නාහිමි විචිත්‍ර ධර්ම දේශනයක් .........................................

v. තම මෑණියන්ගේ නිවසට පැමිණි දයාබර දියණිය පෙරළා තම නිවසට ................................

vi. නැඟණියෝ සියල්ලන්ගේ නෙත් තෙත් කර පතිකුලයට ............................

### පැවරුම්

**01. ගිරා සංදේශයේ එන වෙනත් වර්ණනාවක් උපුටාගෙන කණ්ඩායම් වශයෙන් පන්තියේ දී ගායනය කරන්න.**